# රුහුණ විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් **2026.01.16** දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. ප්‍රධාන ආරක්ෂක නිළධාරී (II ශ්‍රේණිය) ( පුරප්පාඩු -01)

**සුදුසුකම්** :

i. සහකාර පොලිස් අධිකාරී තනතුරට නොඅඩු නිලධාරියෙකු, හමුදා කපිතාන්වරයෙකු හෝ අනෙකුත් සන්නද්ධ සේවාවන්හි ඒ හා සමාන නිලයක නිලධාරියෙකු වීම.

**හෝ**

ii. ආරක්ෂක කටයුතුවල අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ඇති පිළිගත් විශ්ව විද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් උපාධියක් ලබා ඇති පුද්ගලයෙක්;

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 60 නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : U EX 1(II) - රු 85,305 – 3 x 2,020; 91,365 (EB) 93,765; 12 X 2400 – 122,565 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

## 02. පූර්ණකාලීන උප ශාලාධිපති (II ශ්‍රේණිය) (පිරිමි සහ ගැහැණු)

**සුදුසුකම්** :

i. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙක් විය යුතුය. නේවාසිකාගාර පරිපාලනය හා කළමණාකරනය පිළිබඳව පලපුරුද්ද ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 45 නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : U MN 3(II) –රු 71,365 – 18 X 1,190– 92,785 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

## 03. විගණන සහකාර (II ශ්‍රේණිය)

**සුදුසුකම්** :

i. අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේදී

- සිංහල භාෂාව/දෙමළ භාෂාව
- ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
- ගණිතය

යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් එක් වරකදී සමත් වී තිබීම.

**සහ**

ii. අ.පො.ස උසස් පෙළ විභාගයේදී එක් වරකදි (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) සියලු විෂයයන් සමත්ව තිබීම.(අ.පො.ස. උසස් පෙළ විභාගය පැරණි විෂය නිර්දේශය යටතේ එක් වරකදී විෂයයන් තුනක් සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

**සහ**

iii. **තනතුර සඳහා විශේෂිත සුදුසුකම්**

(අ). ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ (CA) මගින් පිරිනමනු ලබන මූලික මට්ටම / බලපත්‍ර මට්ටම-1/ පදනම් මට්ටම / CAB 1/ විධායක මට්ටම හෝ ඊට සමාන සුදුසුකමක් ලබා තිබීම.

**හෝ**

(ආ). ශ්‍රී ලංකා වරලත් කළමනාකාරිත්ව ගණකාධිකරණ (CIMA) මගින් පිරිනමන පදනම් මට්ටම හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම.

**හෝ**

(ඇ). ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (SLIATE) ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA) ලබා තිබීම.

**හෝ**

(ඈ). ශ්‍රී ලංකා ගණකාධිකරණ තාක්ෂණික ශිල්පීය ආයතනය(AAT) මගින් පිරිනමනු ලබන සාමාජිකත්වය (Membership) ලබා තිබීම.

**සහ**

iv. රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විගණන කටයුතු සම්බන්ධයෙන් අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබීම.

- මාස 6 කට නොඅඩු පරිගණක යෙදවුම් සම්බන්ධව පිළිගත් ආයතනයකින් ලබා ගත් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** U MN 2(II) – රු. 61,275 – 18 x 890 – 77,295 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

## 04.තාක්ෂණික නිළධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ - (III ශ්‍රේණිය)

**සුදුසුකම් :**

i. අ.පො.ස උසස් පෙළ විභාගයෙහි ඕනෑම විෂයය ධාරාවක් යටතේ එක් වරකදී විෂයන් තුනක් (03) සමත් වී තිබිය යුතුය.

**සහ**

ii. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ තොරතුරු හා සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණය/ තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ තොරතුරු තාක්ෂණ යන ක්ෂේත්‍රයකට අදාළව පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය නිපුනතා 5 වන මට්ටම (N.V.Q. Level 05) නොඅඩු නිපුනතා සහතිකපත් හෝ වෙනත් සමාන සුදුසුකමක් ලබා තිබීම.

**සටහන :** තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති අය සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** U MT 1(III) – රු 51,095 – 7 X 540; 10 X 640 – 60,575 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම :** ලිඛිත පරීක්ෂණයක් හා/ හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

## 05. තාක්ෂණික නිලධාරී II ශ්‍රේණියේ "ආ" ඛණ්ඩය (පුහුණු වන)

**සුදුසුකම්:**

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් තුන (03) එකවර සමත්ව තිබීම; විෂය සංකලනය/ සංකලන අධ්‍යයන අංශයේ නිර්දේශ මත අදාළ පීඨය විසින් තීරණය කරන පරිදි වේ.

**සහ**

II. අවම වශයෙන් වසරක (පූර්ණ කාලීන) කාල සීමාවක් හෝ ඊට සමාන තනතුරකට අදාළ කුසලතා-මූලික විධිමත් පුහුණු වීමේ වැඩසටහනකින් සමත් වීම මෙම කාර්යය සඳහා කුසලතා මූලික විධිමත් පුහුණුවීමේ වැඩසටහන පිළිගැනීම නිශ්චය කරනු ලබන්නේ අදාළ පීඨය විසිනි.

**සටහන:** තාක්ෂණික නිලධාරී සේවයේ "ආ" ඛණ්ඩයේ යටතේ පත්වීමක් රු. 51,095 + (වෙනත් දීමනා) ස්ථාවර වැටුපක් මත වසර 03 ක කාලයක් සඳහා "පුහුණුවන තාක්ෂණික නිලධාරී" ලෙස සිදු කරනු ලැබේ. පුහුණුව අවසානයේදී, භාණ්ඩ වට්ටෝරු ලේඛනය නඩත්තු කිරීම සහ ඉංග්‍රීසි යතුරු ලියනය කිරීමේ හැකියාව ඇතුළුව රසායනාගාර ශිල්පීය ක්‍රම පිළිබඳ නිපුණතාවයක් ලබා ඇති අය ස්ථිර කර තාක්ෂණික නිලධාරී II ශ්‍රේණියේ - "ආ" ඛණ්ඩයේ ස්ථිර තනතුරකට පත් කරනු ලැබේ.

**වයස:** අවසන් දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් ක්‍රමය :** U-MT 1 (III) රු. 51,095 – 7 x 540; 10 x 640 –60,575 (මාසික) (2027.01.01 දින සිට)

**බඳවා ගැනීමේ ක්‍රමය :** ප්‍රායෝගික පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින්.

## 06. කළමනාකරණ සහකාර (III ශ්‍රේණිය)

**සුදුසුකම් :**

i. අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේදී

- සිංහල භාෂාව/දෙමළ භාෂාව
- ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
- ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් එක් වරකදී සමත් වී තිබීම.

**සහ**

ii. අ.පො.ස උසස් පෙළ විභාගයේදී එක් වරකදි ( සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) සියලු විෂයයන් සමත්ව තිබීම.( මේ සඳහා පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 3 ක් එකවර සමත් වීම ප්‍රමාණවත් වේ.)

**සහ**

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම.

**සහ**

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද ලබා තිබීම.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 30 නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** U-MN 1(III) රු. 49,475-17×540 – 58,655 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම :** ලිඛිත පරීක්ෂණයක් **සහ** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 07. කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) (III ශ්‍රේණිය) ( පුරප්පාඩු -02)

**සුදුසුකම් :**

i. අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේදී

- සිංහල භාෂාව/දෙමළ භාෂාව
- ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
- ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් එක් වරකදී සමත් වී තිබීම.

**සහ**

ii. අ.පො.ස උසස් පෙළ විභාගයේදී එක් වරකදි ( සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) සියලු විෂයයන් සමත්ව තිබීම

**පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**

(අ) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම.

**සහ**

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

<u>තනතුර සඳහා විශේෂිත සුදුසුකම්</u>

ගබඩාකරණය පිළිබඳ වසරක පළපුරුද්ද සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ වාණිජ්‍යා විෂයය සමත්වීම හෝ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ගිණුම්කරණය විෂය සමත්වීම.

**සටහන**: විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන පරිදි ආරක්ෂක තැන්පතුවක් ඉදිරිපත් කළ යුතුය.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 30 නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : U-MN 1(III) රු. 49,475-17×540 – 58,655 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම** : ලිඛිත පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 08.විදුලි කාර්මික (III ශ්‍රේණිය) ( පුරප්පාඩු -01)

**සුදුසුකම්** :

i. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : UPL 3 (III) –රු 48,005 – 16 X 490 ;55,845 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම** : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 09. කාර්මික (III ශ්‍රේණිය) ( පුරප්පාඩු -01)

**සුදුසුකම්** :

i. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : UPL 3 (III) –රු 48,005 – 16 X 490 ;55,845 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම** : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 10. විද්‍යාගාර සහායක (III ශ්‍රේණිය)

**සුදුසුකම්**

**i.** අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ ඉහත තනතුරේ කාර්යයට අදාළ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**හෝ**

ii. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ අදාළ විෂය ක්ෂේත්‍රයේ කර්මාන්ත කුසලතා සමඟ වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : UPL 2 (III) –රු 44,575 – 16 X 490 ;52,415 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම** : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 11.තවාන්කරු (III ශ්‍රේණිය) ( පුරප්පාඩු -01)

**සුදුසුකම්**

**i.** අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ ඉහත තනතුරේ කාර්යයට අදාළ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**හෝ**

ii. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ අදාළ විෂය ක්ෂේත්‍රයේ කර්මාන්ත කුසලතා සමඟ වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : UPL 2 (III) –රු 44,575 – 16 X 490 ;52,415 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම** : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 12. ට්‍රැක්ටර් ක්‍රියාකරු (III ශ්‍රේණිය) ( පුරප්පාඩු -01)

**සුදුසුකම්**

i. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ ඉහත තනතුරේ කාර්යයට අදාළ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**හෝ**

ii. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ අදාළ විෂය ක්ෂේත්‍රයේ කර්මාන්ත කුසලතා සමඟ වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**සහ**

iii. සියලුම බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණතා සහතිකයක් සහ වසර තුනක රිය පැදවීමේ පළපුරුද්දක් තිබිය යුතුය.

**සහ**

iv. අවම උස අඩි 5 අඟල් 2 ½

**සහ**

v. මහාමාර්ග නීති සංග්‍රහ පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතු අතර දිවා රාත්‍රී රාජකාරි සඳහා ශාරීරිකව යෝග්‍ය විය යුතු අතර හොඳ ඇස් පෙනීමක් තිබිය යුතුය.

**වයස:** අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:** U-PL 2 (III) රු. 44,575-16x490-52,415 ප.ව. (2027.01.01 සිට)

**බඳවා ගැනීමේ ක්‍රමය:** වෘත්තීය පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් තෝරා ගැනීම.

## 13. උපස්ථායක (සෞඛ්‍ය සේවා) - කාන්තා (III ශ්‍රේණිය ) ( පුරප්පාඩු -01)

**සුදුසුකම්**

i. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ ඉහත තනතුරේ කාර්යයට අදාල තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා **සහ**තිකයක් ලබා තිබීම.

හෝ

ii. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමග වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** UPL 2 (III) –රු 44,575 – 16 X 490 ;52,415 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම :** වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 14. ආරක්ෂක නියාමක (III ශ්‍රේණිය) (පිරිමි සහ ගැහැණු)

**සුදුසුකම්:**

I. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබිය යුතුය.

**සහ**

II. ක්‍රීඩා සහ සමාජ ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරීව සහභාගී වී තිබිය යුතුය.

**සහ**

III. උස: අඩි 5 අඟල් 4 ට නොඅඩු.

**සහ**

IV. පපුව: අඟල් 32 ට නොඅඩු (පිරිමි අය සඳහා)

**වයස:** අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු **සහ** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:** U PL 1(III) - රු. 42,775-16x450 – ප.ව. 49,975 (2027.01.01 සිට)

**බඳවා ගැනීම :** වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**<u>පොදු සුදුසුකම්</u>**

**සෑම අයදුම්කරුවෙකුම,**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
3. විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය.

**සටහන:**

- තෝරාගත් අපේක්ෂකයින් තම ඉපැයීම්වලින් 10%ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක විය යුතුය. ඒ සමගම ඔබ සේවය කරන ආයතනය විසින් තම අරමුදලින් ඔබගේ මාසික ඉපයීම් වලින් 15% කට සමාන මුදලක් එම අරමුදලට දායක කරනු ලබන අතර එම 15% න් 8% කට සමාන මුදලක් විශ්‍රාම වැටුප් අරමුදල සඳහා ද අනෙක් 7% විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සඳහාද බැර කරනු ඇත. තවද, විශ්වවිද්‍යාලය විසින් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට 3%ක දායකත්වයක් ලබා දෙනු ඇත.

- ඊට අමතරව, රජය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා ගෙවනු ලබන අතර, වැටුප් ගෙවනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 6/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2/2025(i) හි දක්වා ඇති මාර්ගෝපදේශවලට අනුකූලවය.

**<u>අයදුම්පත් සහ විස්තර</u>**

- අයදුම්පත් application.ruh.ac.lk හි මාර්ගගත ඉදිරිපත් කිරීමේ ද්වාරය හරහා පමණක් පිළිගනු ලැබේ.

- අයදුම්කරුවන් විසින් අදාළ සියලුම සහතිකවල සහතික කළ පිටපත් සමඟ 2026 ජනවාරි 16 වන දින හෝ ඊට පෙර වෙබ් ද්වාරය හරහා තම අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

- **විශේෂ සටහන**
  - එක් තනතුරකට වඩා අයදුම් කරන අපේක්ෂකයෙකු මාර්ගගත ඉදිරිපත් කිරීම හරහා එක් එක් තනතුර සඳහා අයදුම් කිරීමේදී අයදුම් කරනු ලබන සියළුම තනතුරු පළමුව එක්වර සළකුණු කර එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කළ යුතුය.

  - ඔබ ඉදිරිපත් කරන ලද අයදුම්පත සම්බන්ධයෙන් කිසියම් තොරතුරක් පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වූ විට කරුණාකර යොමු අංකය භාවිතා කරන්න.

  - විශ්වවිද්‍යාල පද්ධතියක / රජයේ දෙපාර්තමේන්තුවක / රාජ්‍ය සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් මාර්ගගතව ඉදිරිපත් කළ යුතු අතර ඉන්පසු, බාගත කළ අයදුම්පත තම ආයතන ප්‍රධානියා හරහා ලියාපදිංචි තැපෑලෙන් රුහුණ විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන ආයතන අංශයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී වෙත යොමු කළ යුතුය.

  - වසර තුනක (03) ක පරිවාස කාලයක් මත පත්වීම් ලබා දෙනු ලැබේ.

  - අපේක්ෂකයින්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය. මූලික සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් පමණක් විභාගය සහ/හෝ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

  - ඉහත තනතුරු සඳහා ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව මත පදනම්ව, ලිවීමේ විභාගය, සම්මුඛ පරීක්ෂණය හෝ ප්‍රායෝගික පරීක්ෂණය ඇතුළුව තෝරා ගැනීමේ ක්‍රමය තීරණය කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

  - සෑම අයදුම්කරුවකුම තමා විසින් අයදුම් කරනු ලබන සෑම තනතුරක් සඳහාම වෙන් වෙන් වශයෙන් රු. 1,000.00 ක අයදුම්පත් ගාස්තුවක් ගෙවිය යුතුය.

  - අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත්, නියමිත අයදුම්පත් ගාස්තුව නොගෙවා ඉදිරිපත් කරන ලද අයදුම්පත් සහ රුහුණ විශ්වවිද්‍යාලයේ නියමිත ආකෘතියෙන් ඉදිරිපත් නොකරන ලද අයදුම්පත් පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වැඩබලන ලේඛකාධිකාරී
රුහුණු විශ්වවිද්‍යාලය
**2026.01.01**